# COVID-19 වසංගත කාලය තුළ ඉඩම් අයිතිය ආරක්ෂා කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම පිළිබඳ ANGOC ප්‍රකාශය

***COVID-19 කොවිඩ් 19 ගෝලීය වසංගතය ජනතාවක් වශයෙන් අපගේ මූලික දුර්වලතාවයන් සහ අවදානම් තත්ත්වයන් ගණනාවක් පිළිබඳව අනාවරණය කර ඇත. කාරුණික බවෙන් තොර පුළුල් වන අසමානතාවයන්ගෙන් යුත් ආර්ථිකය, අපේ පරිසරය විනාශ කිරීම, නේවාසික පහසුකම් හා ජීවනෝපාය සඳහා වූ ඉඩම් සහ ස්වාභාවික සම්පත් අසාධාරණ ලෙස බෙදී තිබීම , වර්ධනය වන පරිසර දූෂණය හා ජනාකීර්ණ නගර, ආහාර හා පෝෂණය සඳහා මූලික ප්‍රවේශය නොමැතිකම සහ සියලුදෙනාට විශ්වීය සෞඛ්‍ය පහසුකම් නොමැතිකම යනාදී මේ සියල්ල මධ්‍යයේ දේශගුණික විපර්යාසවල බලපෑමට අපේ ලෝකය මුහුණ දෙමින් සිටී.***

මේ අතර, මහා පරිමාණ වන විනාශය/වනාන්තර හෙළි පෙහෙළි කිරීම, වන සතුන්ගේ වාසස්ථාන විනාශ කිරීම හා කැබලි කිරීම, සත්ව හා ශාකවිශේෂ වෙළඳාම, මානවවිද්‍යාත්මක දේශගුණික විපර්යාස - අඛණ්ඩව නව රෝග මතුවීමට හේතු වේ. ගෝලීය වසංගතවලින් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් සත්වයන්ගෙන් මිනිසුන්ට සම්ප්‍රේෂණය වන සත්ව රෝග ලෙස උපත ලබා ඇති අතර ගොවිබිම් සහ වාණිජ කටයුතු සඳහා වනාන්තර එළි පෙහෙළි කිරීම මගින් මෙයට මග පැදිනි.

විද්‍යාඥයින් සහ වෛද්‍ය විශේෂඥයින් COVID-19 වසංගතය සඳහා ප්‍රතිකාර සහ SARS-CoV-2 සඳහා එන්නත් සොයා ගැනීමට උත්සාහ කරන විට, ආර්ථික විද්‍යාඥයින්, තාක්ෂණවේදීන් සහ දේශපාලන නායකයින්ද වසංගතයට ප්‍රතිචාර දක්වා ඇති අතර "නව සාමාන්‍ය" තත්වයට සූදානම් වීමට පටන් ගෙන තිබේ. මෙම වසරේ මාර්තු මාසයේ සිට ශාරීරික දුරස්ථභාවය ඇතිකිරීමට අවශ්‍ය පියවර ගනිමින්, ගමනාගමන තහංචි පැනවීමෙන්, ඇඳිරිනීතිය, රට වසා දැමීම සහ ප්‍රජාව නිරෝධායනය කිරීම වැනි ක්‍රියාමාර්ග හරහා මූලික වශයෙන් මෙම වසංගතය පාලනය කිරීමට රජයයන් උත්සාහ දරා ඇත.

***COVID-19 සෞඛ්‍ය අර්බුදයක් ලෙස ආරම්භ වූ අතර, වර්තමාන සිදුවීම්වලින් පෙනී යන්නේ වසංගතයෙන් වඩාත් බලපෑමක් එල්ල වී ඇති කුඩා පරිමාණ ගොවීන්, කෘෂිකාර්මික කම්කරුවන්, ඉඩම් නොමැති පුද්ගලයින් සහ මුඩුක්කු වැසියන්ගේ දරිද්‍රතාව, කුසගින්න සහ මන්දපෝෂණය වැනි කරුණු පිළිබඳ අර්බුදයක් බවට මෙය ක්ෂණිකව විකාශනය වෙමින් පවතින බවයි.***

කොවිඩ් 19 වසංගතය ව්‍යාප්ත වීමට පෙර පවා, 2018 දී ලොව පුරා මිලියන 821 ක ජනතාවක් මන්දපෝෂණයෙන් පෙළෙන බවට ඇස්තමේන්තු කර ඇති අතර ලෝකයේ කුසගින්නෙන් පෙළෙන බහුතරයක් අඩු ආදායම්ලාභී රටවල ජීවත්වේ. මෙම ජනගහනයෙන් 12.9% ක් මන්දපෝෂණයෙන් පෙළේ .[1]

ආහාර සැපයුම් දාමයේ සහ වෙළඳපලවල ඇති කරන ලද අහිතකර තත්ත්වයන් මගින් මෙම වසංගතය ආහාර පද්ධතියට සෘජුවම බලපෑම් ඇතිකළේය. ඒ සමගම, රැකියා අහිමිවීම සහ මිලදී ගැනීමේ ශක්‍යතාවය පහළ යාමෙහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් දුප්පත් හා අවදානමට ලක්වූවන්ගේ ආහාර නිෂ්පාදනය හා බෙදා හැරීමේ හැකියාව අඩාල විය.

***ඉඩම්, වෙළඳපල සහ යෙදවුම් සඳහා ප්‍රවේශය නොමැතිවීම හේතුවෙන් ගොවීන්ගේ ජීවනෝපායන් තවදුරටත් අවදානම් තත්වයට පත්ව ඇත.*** තම ජීවනෝපාය සඳහා ගොවිපල නොවන හා ගොවිපොළෙන් බැහැරව රැකියාවල යෙදෙන ආහාර නිෂ්පාදකයින්ට ඔවුන්ගේ රැකියාවට යාමට ඇති හැකියාව සීමා වී ඇත. බොහෝ ජාතීන්ගේ ආර්ථිකයේ කොඳු නාරටිය බවට පත් වී තිබෙන කෘෂිකර්මාන්තය වන බැවින් රට වසා දැමීම සහ වෙළඳාම් කටයුතුවලට සහ ගමනාගමනයට පනවන ලද තහංචි මගින් ආසියාව පුරා කුඩා ගොවීන්ගේ ජීවනෝපායන් අඩපණ වී ඇති අතර ආහාර දාමයන්ට බාධා ඇතිවී තිබේ.

***වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා නිවෙස්වල රැඳී සිටින ලෙස රජයන් ජනතාවගෙන් ඉල්ලා සිටින හෙයින්, සුරක්ෂිත ඉඩම් හා නිවාසවලට වී කාලය ගත කිරීම සෑම කෙනෙකුටම වෙන කවරදාටත් වඩා වැදගත්වී වී තිබේ.*** ප්‍රවාහන කටයුතු සීමා කිරීමත් සමග දෛනික වැටුප් ලබන කම්කරුවන්ට සහ අවිධිමත් අංශයේ සේවකයින්ට ඔවුන්ගේ ආදායම අහිමි වන අතර නීත්‍යානුකූල සේවා ගිවිසුම් නොමැතිවීම' සහ කුලී ගෙවීමට නොහැකිවීම නිසා බොහෝ දෙනෙකුට නිවාස හැර යන ලෙස බල කෙරෙයි.

---

[1] According to the "State of food security and nutrition in the world (SOFI)" (FAO, IFAD, UNICEF, WFP and WHO, 2019). See https://www.wfp.org/publications/2019-state-food-security-and-nutrition-world-sofi-safeguarding-against-economic#:~:text=About%20the%20series%3A%20The%20State,challenges%20for%20achieving%20this%20goal

වඩාත් අවදානමට ලක්ව ඇත්තේ නිවාස නොමැති සහ සංක්‍රමණික කම්කරුවන් වන අතර, ඔවුන්ට නගරවල රැකියා අහිමිවීමත් සමඟ ඔවුන්ගේ ග්‍රාමීය ප්‍රදේශ වෙත ආපසු යාමට බල කර ඇත. බොහෝ දෙනෙක් තමන්ගේ පවුලේ අය සොයාගෙන ගම්බිම් කරා කිලෝමීටර් සිය ගණනක් ඇවිද යති. බිලියන 1.3 ක ජනගහනයක් සහිත ඉන්දියාව ඓතිහාසිකව මෙතරම් විශාලකාලයක් සඳහා ප්‍රථමවරට වසාදැමීම නිසා මිලියන ගණනක් සංක්‍රමණික ශ්‍රමිකයන් රැකියා විරහිතව ප්‍රධාන නගරවල අතරමං වී ඇති අතර දිගු ගමනක් ගෙවා ඔවුන්ගේ දුර බැහැර ගම්බිම් වෙත යාමට තරම් අවදානමක් ගැනීමට ඔවුන්ට බල කෙරී ඇත.

ඔවුන් අතරින් දරුණුතම ලෙස පීඩාවට පත්ව ඇත්තේ නාගරික දුප්පතුන් ය - සුරක්ෂිත නොවන ප්‍රදේශවල, දුර්වල නිවාස තත්වයන් තුළ, ප්‍රමාණවත් වාතාශ්‍රය හා සනීපාරක්ෂාව නොමැති සීමිත අවකාශයන් තුළ, සෞඛ්‍ය තත්ත්වය පිරිහීමෙන් වසංගතය ව්‍යාප්තවීම සිදු වූ විට තම ප්‍රජාවන් විසින් අපකීර්තියට හා නෙරපා හැරීමේ අවදානමකට ලක්වූ පුද්ගලයින් බවට ඔවුන් පත්වී තිබේ . ඔවුන්ට සෞඛ්‍ය සේවා සඳහා අඩු ප්‍රවේශයක් ඇති අතර, ඔවුන්ගේ රැකියා සුරක්ෂිතතාවය නොමැතිකම හේතුවෙන් ආහාර මිල ඉහළ යාමෙන් ඔවුන් වඩාත් අවදානම් තත්ත්වයට පත්වන කොටස් බවට පත් වේ. පෝෂ්‍යදායී ආහාර නොමැතිකම ආසාදන හා රෝගාබාධවලට ගොදුරු වීමේ අවදානම වැඩි කරයි.

*අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට අයත් දුප්පතුන්, වැඩිහිටියන්, කාන්තාවන් සහ ළමයින් වෛරසය ආසාදනය වීමේ වැඩි අවදානමකට මුහුණ දෙනවා පමණක් නොව, ඔවුන් සමහර අංශවල අඩු අවධානයටද ලක්වේ.* රජයේ සම්පත් සඳහා වන ප්‍රමුඛතා අතර තරඟකාරිත්වය මගින් සෞඛ්‍ය රැකවරණය සහ දිගු කාලීන ආහාර සුරක්ෂිතතා ප්‍රමුඛතා අතර ආතතිකාරී තත්වයකට හේතු විය හැක. කොවිඩ් 19 නිසා පාසල් වසා දැමීම නිසා ඉන්දියාවේ මිලියන 120 කට වඩා වැඩි ළමුන්ට ඔවුන්ගේ පාසල් දිවා ආහාරය ලබාගැනීමට නොහැකිවී ඇත. කාන්තාවන් සහ ළමුන් වැඩි කාලයක් නිවසේ ගත කිරීම නිසා ගෘහස්ථ අපයෝජන සිදුවන අවස්ථාවන් වැඩිවී ඇත. දැඩි නිරෝධායක නීති ක්‍රියාවට නංවා ඇති නිසා ඔවුන්ට උදව් ලබාගත හැකි ආයතන වලට පිවිසීමට නොහැකිවී තිබේ.

ගෝලීය වසංගත තත්වය නිසා ආර්ථිකය කඩාවැටීම හේතුවෙන් ගෝලීය වශයෙන් බිලියනයකින් අඩකින් හෝ සමස්ථ මානව ජනගහනයෙන් 8% ක් ලෙසින් දරිද්‍රතාවය වැඩිවීමට හැකිබවට අඳුරු අනාවැකි පළවෙමින් තිබෙන අතර මෙය 1990 සිට දශක තුනක කාලයක් තුළ ගෝලීය වශයෙන් දරිද්‍රතාවය ඉහළ යන ප්‍රථම වතාව වේ.

*රජයන් විසින් කෙටිකාලීන සමාජය සවිබලගැන්වීමේ වැඩසටහන්, දුප්පතුන් සඳහා ආරක්ෂණ ක්‍රමවේද/ ජාල සහ ආයතනික සහයෝගය ලබා දී තිබේ.* එහෙත්, ජනතාව සහ ප්‍රජාවන් කේන්ද්‍රගත කරගන්නා පරිදි සංවර්ධන ආකෘතියේ ප්‍රබල සංශෝධනයක් සිදු නොකරන්නේ නම්, මෙම උත්සාහයන් හුදෙක් අපව "සාමාන්‍ය ලෙස අපගේ වැඩකටයුතු කරගෙන යාමක් බවට පත්කරනු" කරනු ඇති අතර මෙම කොවිඩ් 19- ප්‍රතිචාර වැඩසටහන් ක්‍රියාවට නංවන සංවර්ධන ආධාර සහ අරමුදල් සපයනන් සඳහා "එය මාසයේ කටගැස්ම" බවට පත්වනු ඇත.

*මෙම ආහාර හා මුදල් බෙදා හැරීමේ වැඩසටහන් කුසගින්න සඳහා තාවකාලික විසඳුමක් වුව ද, එයට හේතු වන මූලික කරුණු විසඳීමට අදහස් නොකෙරේ.* ආරක්ෂිත ජාල වැඩසටහන් පිළිබඳ ප්‍රධාන ප්‍රශ්නය වන්නේ මේවා දිගු කාලීනව තිරසාරද යන්න සහ දිළිඳුකම, සාගින්න සහ මන්දපෝෂණයෙන් මිදීමට දුප්පතුන් සවිබල ගන්වන්නේ ද යන්නයි. දැනටමත් සීමාකාරී අයවැයක් සහිත සංවර්ධනය වෙමින් පවතින රටවල් විදේශ ණය ලබාගැනීම් වෙත යොමුවී ඇති අතර එමඟින් අපේ දරුවන් විසින් දැරිය යුතු ජාතික ණය වැඩි කිරීමට හේතු වේ. තවද, කොවිඩ් -19 වසංගතය සඳහා ප්‍රතිචාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී දූෂණ ක්‍රියා පිළිබඳ වාර්තා තිබේ.

රජයේ ප්‍රමුඛතා සහ අවධානය වෙනස් වීමත් සමඟ, නීති විරෝධී ගස් කැපීම, නීති විරෝධී පතල් කැණීම් සහ ඉඩම් අත්පත් කර ගැනීම මගින් වසංගත තත්ත්වයෙන් ප්‍රයෝජන ගැනීමට උත්සාහ කරන පුද්ගලයින් සහ කණ්ඩායම් පිළිබඳ වාර්තා ද තිබේ. පිලිපීනයේ, පසුගිය මාර්තු මාසයේ රට වසා දැමීම ආරම්භ වූ දා සිට අවම වශයෙන් නීති විරෝධී පතල් කැනීමේ කටයුතු හතරක් ආරම්භ කර ඇත.[2]

සහල්, ධාන්‍ය, මාංශ භෝග, එළවළු සහ මුහුදු ආහාර ප්‍රධාන සැපයුම්කරුවන් ලෙස සිය කර්තව්‍යය අඛණ්ඩව කරගෙන යාමෙන් ආසියාව පුරා සිටින කුඩා ගොවීන් මෙම වසංගත කාලය තුළ පෙරමුණ ගෙන කටයුතු කරන්නන් වුව ද, කුඩා ගොවීන් හා නිෂ්පාදකයින්, ග්‍රාමීය කලා ශිල්පීන් සහ ආදිවාසීන්ට ජීවනෝපායන් සඳහා අවශ්‍ය ඵලදායී සම්පත්

(එනම්, ඉඩම්, ජලය, වනාන්තර සහ වෙරළ තීරයන්) සඳහා ඇති ප්‍රවේශය සහ පාලනය අහිමි වී ඇත.

[2] As shared by Alyansa Tigil Mina during the Webinar on "*COVID-19 in the Age of Extractivism and Climate Change - Voices From the South,"* 22 April 2020, organized by Peoples Dialogue.

ආහාර නිෂ්පාදන කර්මාන්තයේ ආයතනික පාලනය වැඩි කිරීම හේතුවෙන් ආසියාවේ කුඩා ගොවීන් නව බාධක තලයකට මුහුණ දෙන විට ඔවුන්ගේ තත්වය තවදුරටත් සංකීර්ණ කරයි - සේවා, ණය සහ වෙළඳපල වෙත ප්‍රවේශ වීමේ දුෂ්කරතාවය, දුර්වල ව්‍යාප්ති සේවා සහ කුඩා ගොවීන්ට එරෙහිව ක්‍රියාත්මක වන මිලකරණ ප්‍රතිපත්ති මේවාට අයත්වේ. COVID-19 වසංගතයේ බලපෑමත් සමඟ ගොවීන් වටිනාකම් දාමයෙන් දුරස්ථ කිරීමේ ක්‍රියාවලිය තවත් පුළුල් කර තිබේ.

*දේශපාලනඥයින් සහ රාජ්‍ය නායකයින් ද වසංගතයෙන් තම බලය තහවුරු කර ගැනීම සඳහා වාසි ලබා ගෙන ඇති අතර එමගින් කුසගින්න හා දරිද්‍රතාවයට තුඩු දෙන අසමානතාවයන් තවදුරටත් වැඩි කරයි.* ආසියානු රටවල් ගණනාවක් පුරා, සිවිල් වැසියන් සහ සමාජ ක්‍රියාකාරීන් රාජ්‍ය මිලිටරිකරණය හා ආක්‍රමණශීලී පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් වැඩිවීම පිළිබඳ බාධාකාරී අවස්ථා පෙන්වා දෙයි; විරුද්ධ පක්ෂය, මාධ්‍ය සහ කතා කිරීමේ නිදහස ආණ්ඩුව විසින් මර්දනය කිරීම මේ අතරවේ. පිලිපීනයේ, ආණ්ඩුවට එරෙහි විරෝධය මැඩපැවැත්වීම සඳහා පනවන ලද 2020 ත්‍රස්ත විරෝධී පනත යටතේ විරුද්ධවාදීන්ට හා ක්‍රියාකාරීන්ට තර්ජනය කරනු ලැබේ. වසංගතය හේතුවෙන් රට වසා දමා ඇති කාලයේදී සහ මහජන මතයට සහ විවාදයට අවස්ථාවක් නොමැති වාතාවරණයක් තුළ දී එවැනි නීති බලාත්මක කරන ලදී.

*අද, කොවිඩ් -19 අපට යමක් උගන්වා ඇත්නම්, එය පුද්ගලයන් වශයෙන් පමණක් නොව සාමූහිකව සමාජයක් ලෙස ද නැවත අපගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය ගොඩනැඟිය යුතුය යන්නය .*

ඒ හා සමාන අර්බුදයන්ට එරෙහිව ලෝකය දිගටම අරගල කරනු ඇත, නමුත් ඉදිරි පරම්පරාවන්ට හැකි උපරිම ප්‍රතිලාභ සහතික කිරීම සඳහා අප එක්ව ක්‍රියා කළ යුතුය. අනාගතයේදී අපේ දරුවන් හැදී වැඩීමට කැමැත්තක් දක්වන ඔවුන් දියුණුවට පත්වන සමාජයන් අප විසින් නිර්මාණය කළ යුතුය. පැරණි සාමාන්‍යයට නැවතත්යාම සහ සුපුරුදු ලෙස කටයුතු කිරීම සිදුනොකළ යුතු අතර ඒ වෙනුවට, සමාජයන් හා ප්‍රජාවන් යථා තත්ත්වයට පත් කර වඩා හොඳ තත්වයක් ගොඩනගා ගත යුතුය.

එක්සත් ජාතීන්ගේ මහලේකම් ඇන්ටෝනියෝ ගුටරෙස් ප්‍රකාශ කළ පරිදි, "අපි වසංගත, දේශගුණික විපර්යාස සහ අප මුහුණ දෙන තවත් බොහෝ ගෝලීය අභියෝග හමුවේ වඩාත් ඔරොත්තු දෙන වඩාත් සමාන, සියල්ලන් අන්තර්කරනය වූ සහ තිරසාර ආර්ථිකයන් සහ සමාජයන් ගොඩනැඟිය යුතුය.."[3]

*සංවර්ධන ආකෘති මිනිසුන්ට සහ පරිසරයට ප්‍රමුඛත්වය දෙන ඒවා බවට පරිවර්තනය කළ යුතු* ඉඩම් හා ස්වාභාවික සම්පත් සඳහා ප්‍රවේශය සහ පාලනය කුඩා නිෂ්පාදකයින් සතුව පැවැතිය තිබිය යුතුය - ප්‍රමාණවත් හා ආරක්ෂිත හා පෝෂ්‍යදායී ආහාර ස්ථායීව නිෂ්පාදනය කිරීමට ඔවුන්ට හැකියාව ඇති බව සහතික කිරීම සඳහා රජයේ සහාය ප්‍රමාණවත්ව තිබිය යුතුය.

නව රෝග ඇතිවීම හා පැතිරීම වැළැක්වීම සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා ආදිවාසීන් සහ වනජීවීන් විසින් ඉටු කරන කාර්යභාරයේ වැදගත්කම හඳුනාගත යුතුය. තවද වසංගත වැනි අර්බුද හේතුවෙන් ඇති වන හදිසි කම්පනවලට ඔරොත්තු දීමට ජනතාවට සහ රාජ්‍ය යටිතල ව්‍යුහයට හැකි බව සහතික කිරීම සඳහා සාධාරණ ආර්ථික තත්වයන්, සාධාරණ වැටුප් සහ පුළුල් මහජන සෞඛ්‍ය සේවාවක් සඳහා ප්‍රමුඛතාවය දිය යුතුය.

සැමට ආහාර ලැබීම සහතික කිරීම සඳහා අප අපගේ සුසමාදර්ශ පිළිබඳව නැවත සිතා බැලිය යුතුය - එනම් උදාහරණයක් වශයෙන් , ආහාර සමානව බෙදා හරින බවට වග බලා ගැනීම සහ දුප්පතුන්ට සහ ආන්තිකයන්ට ප්‍රවේශ විය හැකි බවට වග බලා ගැනීම. රාජ්‍යයන් ඔවුන්ගේ අවධානය ගෝලීය හා ජාතික වටිනාකම් දාමයන් කෙරෙහි පමණක් යොමු කිරීම ප්‍රමාණවත් නොවේ. සමස්ත ආහාර පද්ධති උපාය මාර්ගයක් ලෙස, සියලු දෙනාටම ආහාර වෙත ප්‍රවේශ වීම සහතික කිරීම සඳහා දේශීය ආහාර පද්ධති සහ කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ට විශේෂිත සහයෝගය ලබාදීම සහ ශක්තිමත් කිරීම සඳහා රජයන් පියවර ගැනීම අවශ්‍ය වේ.

කල් පවත්නා ආහාර සුරක්ෂිතතාව ගොඩනැගීම සඳහා වන මූලික මූලධර්මය වන්නේ ආහාර කිලෝමීටර අඩු

කිරීම හෝ"ආහාර නිපදවන ස්ථානය සහ එම නිෂ්පාදිත ආහාර පරිභෝජනය කරන ස්ථානය අතර දුර හැකි තාක් අඩු කිරීමට" ක්‍රියාකිරීමයි ..[4] ප්‍රජාව විසන් නායකත්වය දරණ ඔරොත්තු දෙන සහ ප්‍රතිචාර පද්ධති සඳහා ආයෝජනකිරීම සඳහා පවත්නා තත්වයෙන් වෙනස්වීමට අපි කටයුතු කළ යුතුයි

---

[3] Shared responsibility, global solidarity: Responding to the socio-economic impacts of COVID-19 (March 2020). See https://www.un.org/sites/un2.un.org/files/sg_report_socio-economic_impact_of_covid19.pdf

[4] Bangkok Declaration (April 1996). Drafted and signed by some 101 CSOs from Asia-Pacific, the statement analyzed and recommended priority areas for action as input to the World Food Summit (WFS).

මෙම ප්‍රවේශය මගින් කුඩා පරිමාන නිෂ්පාදකයින්ට ඉඩම් සහ සම්පත් ලබාගැනීමට ඇති අයිතිය තහවුරු කළ යුතුවේ. කුඩා පරිමාන නිෂ්පාදකයින්ට සෘජුව ප්‍රවේශවිය හැකි ප්‍රාදේශීය වෙළඳපළවල් සංවර්ධනය කිරීම සඳහා සහ ඔවුන්ගේ නිෂ්පාදන සඳහා සාධාරණ මිළක් ලබාදීම කෙරෙහි අප අවධානය යොමුකළ යුතුය. මෙමගින් නිෂ්පාදකයින්ගේ සහ පාරිභෝගිකයින් අතර සෘජු සම්බන්ධතාවක් සහ වගවීම ගොඩනගනු ලබනු ලබන අතර නැවුම් නිෂ්පාදන ලබාගැනීමටත් දීර්ග දුර ප්‍රමාණයක් ආහාර ප්‍රවාහනය කිරීම මගින් ඇතිවන්නා වූ කාබන්ඩයොක්සයිඩ් පරිසරයට මුදාහැරීම අවම කිරීමටත් හේතුවනු ඇත.

ජාතික සංවර්ධන උපායය මාර්ගයන්හිදී කෘෂිකර්ම ප්‍රතිසංශෝධන සහ ඉඩම් අයිතිය සුරැකීම වැදගත් කොටසක් විය යුතුය. ආසියාවේ තිරසර ස්වයං ආහාර නිෂ්පාදනය සහ සංවර්ධනය ලඟාකරගත හැක්කේ ජෛවගෝලයට හිතකර කෘෂිකාර්මික  ගොවිතැන් තාක්ෂණය, තිරසර අන්දමින් සම්පත් කළමනාකරණය සහ ප්‍රජාසවිබලගැන්වීම සමගින් වඩාත් සමානාත්මතාවයෙන් යුතුව ඉඩම් නැවත බෙදාදීම මගිනි.

ඉඩම් යනු ප්‍රජාවට ආර්ථික වත්කමක් පමණක් නොවේ.  ඉඩමකට ප්‍රවේශවීම මගින් ජීවිතය පවත්වාගැනීමට මාධ්‍යයක් පමණක් නොව යමෙකුට  මානව අභිමානය සහ ආරක්ෂාව පිළිබඳ හැගීමක් මෙන්ම  කුසගින්න සහ දරිද්‍රතාවයෙන් මිදීමට අවස්ථාවක්ද හිමිවේ. ඉඩම්වලට  වඩාත් සමානාත්මාවයෙන් යුතුව ප්‍රවේශවීමට හැකියාව ලැබීම මගින් ඉඩම් සම්බන්ධ ගැටුම් අවම වීමටත් ගම් වලින් පිටතට ජනයා සංක්‍රමණය සහ ආර්ථික සහ දේශපාලනික ස්ථාවරත්වය සඳහා අවශ්‍යවන්නාවූ පොදුවේ සාමය ප්‍රවර්ධනය කිරීමට හේතුවේ.

*කුඩා පරිමාන නිෂ්පාදකයින්ට ඔවුන්ගේ ඉඩම්වල හිමිකම සහ පාලනය කිරීමේ බලය තිබිය යුතුයි. ස්වදේශික ප්‍රජාවන්ට ඔවුන්ගේ පාරම්පරික පාලන ක්‍රමයට අනුව ඉඩම් පාලනය කිරීම ඇති අයිතිය පිළිගැනීම සමගින් ඉඩම් අයිතිය තිබිය යුතුයි.  මේවා ගැටුම් අවම කිරීමට සහ සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීමට අත්‍යාවශ්‍ය සහ වැදගත් පියවරවේ.*

විවිධත්වයෙන් යුත් සහ තිරසර කෘෂිකර්මයක් කුඩාපරිමාන ගොවිතැන්වල ස්ථාපිතවීම සඳහා ඉඩම් අයිතිය මෙන්ම ආරක්ෂාවද අවශ්‍යවේ. අතීතය පුරාම ආසියාවේ කෘෂිකර්මයේ සහ ආහාර සුරක්ෂිතතාවයේ කොඳුනාරටිය ලෙස පැවතීයේ කුඩා පරිමාන ගොවීන් සහ නිෂ්පාදකයින්ය.  ලෝකයේ කෘෂිකාර්මික කුටුම්භ වලින් 75% ක් තිබෙන්නේ ආසියානු කළාපයේය. ඔවුන්ගෙන් 80% ක් කුඩා පරිමාන ගොවීන් සහ නිෂ්පාදකයින් වේ.

වාණිජ කර්මාන්තයක් ලෙස සිදුකරනු ලබන කෘෂිකර්මයේ සිට ස්වභාවික සහ දේශීය යෙදවුම් උපයෝගී කරගනිමින් ඔරොත්තුදීමේ හැකියාව ගොඩනංවන ප්‍රජාව පදනම් කරගත් ජෛවගෝලයට හිතකාමී ගොවිතැන් ක්‍රමවලට පැහැදිලිව මාරුවීම අත්‍යාවශ්‍යවේ. මෙසේ කිරීමෙන් පසෙහි තත්වය නැවත ගොඩනැංවීමට වගාවන්ට පොහොර සැපයීමට, කෘමීන්ට එරෙහිව සටන් කිරීමට හැකිවේ.  නියමිත ආකාරයෙන් ජෛවවිවිධත්වය පවත්වාගෙන යාම සහ කාබන් පරිසරයට මුදාහැරීම අවම  ජෛවගෝලයට හිතකාමී ගොවිගැන් ක්‍රම උපයෝගී කරගැනීම මගින් බාහිරින් එන යෙදවුම් වන  කෘමිනාශක සහ රසායනික පොහොර මත රඳාපැවීම අඩු කරන අතර එමගින් ගොවීන් හදිසියේ ඇතිවන මිළ උච්ඡාවචනයන්ට ගොදුරුවීමේ අවධානම අඩුකරනු ඇත. ජෛවගෝලයට හිතකාමී ගොවිතැන් ක්‍රම කෙටි සැපයුම් දාම සහ දේශීය කලාපීය වෙළඳපළවල්වල වැදගත්කම  අවධාරණය කරනු ලබයි.

ANGOC

## ක්‍රියාත්මක වීම සඳහා පවත්නා අවශ්‍යතාවය

මෙම වසංගත තත්වය මගින් අන්තර්ජාතික ප්‍රජාවට රජයයන්ට සහ ජනතාවට ඉක්මන් ක්‍රියාමාර්ගයන් හා ශක්තිමත් දැඩි පියවර ගන්නා ලෙසට බලකර සිටී

### *ජගත් මට්ටමින් ඉක්මනින් ගතයුතු පියවර*

> කොවිඩ් 19 සඳහා ආරක්ෂාකාරී ඵලදායී එන්නතක් නිෂ්පාදනය කිරිමටත් එය සකස්කිරිමෙන් පසුව විශාල වශයෙන් නිපදවීමටත් ලෝකයේ සිටින සියලුම ජාතීන්ට සහ ජනතාවට විශ්වීය වශයෙන් නොමිළයේ ලබාගැනීමටත් බුද්ධිමය දේපළ නීතියටතේ සීමා කිරීම් වලට යටත් නොවීමත් සිදුවිය යුතු බවට වන අදහසට අපගේ සහාය දක්වන්නෙවමු.[5]

> කොවිඩ් 19 වෛරසයට එරෙහිව සටන් කිරීම සඳහා සියලු දෙනාගේ අවධානය යොමුකරගැනීම පිණිස ලෝකයේ සියලුම ප්‍රදේශවල සිදුවන ආයුධ සන්නද්ධ ගැටුම් සඳහා සටන් විරාමයක් ක්‍රියාත්මක කරනමෙන් ඉල්ලා සිටින විවිධ වූ ජාතීන් සහ කණ්ඩායම් සමග අපි එක් වන්නෙමු. රජයයන් ඔවුන් විසින් ගනුලබන ක්‍රියාමාර්ග ගැටුම් සංවේදීතාවයෙන් යුත් වෙනස්කොට සැලකිල්ලක් නොදක්වන අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීති සහ ප්‍රමිතීන්ට අනුකූල වන්නාවූ සහ ගැටුම් වලින් බලපෑමට ලක්වූ ප්‍රජාවන්ට, අනාථයන්ට, අභ්‍යන්තරවශයෙන් අවතැන්වූ පුද්ගලයින්ට, ආබාධිත පුද්ගලයින්, කාන්තාවන්, ළමුන් සහ වයස්ගත පුද්ගලයින් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම් පිළිබඳව සංවේදී ඒවා විය යුතුය.

> සහන පැකේජ ක්‍රියාත්මක කිරීමේදී විශේෂයෙන්ම අභ්‍යන්තර ගැටුම් වලින් පීඩාවිදින සහ දරිද්‍රතාවයෙන් පෙළෙන සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ණය සහන ලබාදීමටත් ලබාගෙන තිබෙන ණය වලින් නිදහස් කිරීමටත් කඩිනමින් කටයුතු කරන මෙන් අපි ඉල්ලා සිටිමු.

> 2019 වසරේ දෙසැම්බර් මාසයේදී එක්සත් ජාතීන්ගේ මුලස්ථානය 2021 දී ආහාර පද්ධති සමුලුවක් පවත්වන බව දැනුම් දුන්නේය. මෙහි ඉලක්කය වූයේ කාළගුණික වෙනස්කම් මගින් ඇතිවන අභියෝගවලට මුහුණදීම, ආහාර පද්ධතීන් සියලුදෙනා අන්තර්කරණය වු ඒවා වීම සහ දිගුකල් පවත්නා සාමය ඇතිකර ගැනීම සඳහා 2030 සමස්ථ තිරසර සංවර්ධන අරමුණු න්‍යෘයපත්‍රය තුළින් ආහාරසැපයුම් පද්ධතින් හි ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා කටයුතු කිරීමය. කෙසේවෙතත් ආහාර සම්බන්ධයෙන් අවධානය දක්වන කුඩා පරිමානයේ ආහාර නිෂ්පාදකයින්ගේ සංවිධාන සහ අනෙකුත් සිවිල් සංවිධාන වල අර්ථාන්විත සහභාගිත්වය සහ ඵලදායී හඩ නැගීමකින් තොරව සිදුකරන ලබන මෙවැනි සමුලුවක් ප්‍රතිඵලයක් නොමැති කාර්යයක් වනු ඇත.

### *රජයේ ප්‍රතිචාර සඳහා කඩිනම් ක්‍රියාමාර්ග*

> ආහාර ආධාර සහ ආර්ථික පුනරුත්ථාපන වැඩසටහන් වලින් ඔබ්බට ගොස් කුඩා පරිමානයේ ගොවීන් සහ නිෂ්පාදකයන්, ස්වදේශීය ප්‍රජාවන් සහ දරිද්‍රතාවයෙන් පෙළෙන නාගරික ජනතාවගේ අවශ්‍යතා වලට සෘජුවම ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස්කිරීමට කෘෂිකාර්මික සහ ආහාර පද්ධති පාලනය ප්‍රතිව්‍යුහගත සහ පරිනාමනය විය යුතුය.

> රජයයන් ප්‍රමුඛතාවන් වෙනස් කරගත යුතුය. විශේයෙන්ම වසංගත තත්වයෙන් බලපෑමට ලක්වූ දිළිඳුපුද්ගලයන්ට ඇතිවූ බලපෑම අවම කිරීම සඳහා ජාතික අයවැයෙන් සපයන ප්‍රතිපාදන වැඩිකළ යුතුය. සම්පත් ඵලදායී අන්දමින් භාවිතා කිරීම සඳහා දූෂණය නැවැත්විය යුතුය. මෙවැනි වැඩසටහන් නිසිපරිදි විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාත්මක වීම තහවුරු කිරීමට සිවිල් සමාජයේ සහභාගිත්වය ඇතිව අධීක්ෂණ වැඩසටහන් සිදුකිරීම සහ මාධ්‍ය ස්වාධිනත්වය ස්ථාපිත කළයුතුය.

> ප්‍රජාතන්ත්‍රවාදය සඳහා පවත්නා අවකාශය අඩුවෙමින් පවත්නා වාතාවරණයක විශේෂයෙන්ම පවත්නා වසංගත තත්වය නිසා මෙම තත්වය තවදුරටත් වැඩිවූ පසුබිමක සිවිල් සමාජ සංවිධාන, ඉඩම් සහ මානව අයිතිවාසිකම් සුරකින්නන් සහ මාධ්‍යවල අයිතිවාසිකම් වලට ගරුකිරීමත් හා ආරක්ෂා කිරීමත් සිදු කළයුතුයි.

> ආහාර නිෂ්පාදනයේ, හැසිරවීමේ සහ සැකසීමේ නියැලී සිටින පුද්ගලයින්ද ඇතුළත්ව ගොවීන්, ගොවිපළ

[5] See GCAP Asia statement, May 2020

සේවකයින්, ධීවරයින් සහ ස්වදේශික ජනතාව කොවිඩ් 19 වලට ගොදුරුවීම සහ පැතිරීම වළක්වා ඔවුන් ආරක්ෂා කර සුරක්ෂිතභාවය තහවුරු කරන්න.

> රැකවරණය සලසන්නන්, ආහාර නිෂ්පාදකයින්, සකසන්නන් ලෙස කාන්තාවන්ගේ කාර්යයභාරයේ වටිනාකම හඳුනාගන්න. පැනනැගෙමින් පවත්නා අභියෝගයට මුහුණදීමට ජනතාව සහ ප්‍රජාවන් අතර එක්සත්භාවයට ප්‍රමුඛත්වය ලබාදීමට සහ සම්බන්ධීකරණයෙක් සහ සහයෝගයෙන් කටයුතු කිරීමට සියලුදෙනා සවිබලගැනිවීමට සහාය ලබාදෙන්න.

> කොවිඩ් 19 අර්බුදය පවත්නා අවස්ථාවේදී සහ ඉන් පසුව වඩාත් දරිද්‍රතාවයෙන් පෙළෙන සහ වඩාත් අවදානමට ලක්වී සිටින ජනතාවට සමාජ රැකවරණ පද්ධතීන්වල සහාය ලබාදීම තහවුරු කරන්න. පෝෂණිය ගුණාත්මක ආහාර ප්‍රමාණවත්ව සියලුදෙනාට ලැබෙන බව තහවුරු කරමින් ආහාර සඳහා සියලුදෙනාට ඇති අයිතිය සුරකින්න.

> විදේශයන්හි සිට සහ නාගරික ප්‍රදේහයන්හි සිට ග්‍රාමීව ප්‍රදේශකරා ආපසු එන සංක්‍රමණිකයින්ට සහාය ලබාදෙන්න. සියලු දෙනාගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පරීක්ෂා කිරීම සහ සම්බන්දවූ/ ස්පර්ශවූ අය හඳුනා ගැනීම සක්‍රීයව සිදුකළ යුතුවේ.

***සිවිල්සමාජය, ප්‍රජාවන් සහ ජනතාව විසින් වහාම දක්විය යුතු ප්‍රතිචාර***

- රජයේ සහ මානුෂීයසේවාවන්හි සහාය නොමැති අවස්ථාවන්හිදී ප්‍රජාවන් සහ සිවිල් සමාජ සංවිධාන මෙම අර්බුදයේදී වැදගත් කාර්යයභාරය් ඉටුකර තිබේ. මෙම නිසා රජය විසින් සිදුකරණු ලබන කොවිඩ් 19 ප්‍රතිචාර වැඩසටහන් අඛණ්ඩව අධීක්ෂණය කිරීමට හා ඔවුන්ගේ අභිදේශන අඛණ්ඩව පවත්වාගෙන යාමට අප විසින් සිවිල් සමාජ සංවිධාන දිරිමත් කරනු ලැබේ.

- සිවිල් සමාජ සංවිධාන ගොවින් සහ ධීවර ප්‍රජාව, අවිධිමත් අංශයේ සේවකයින් ආන්තීකරණයට පත්වූ සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්, ප්‍රජා සෞඛ්‍ය සේවකයින්, ස්වදේශීය ප්‍රජාවන්, තරුණයින් සහ කාන්තා කණ්ඩායම් සමග අඛණ්ඩවම වැඩකරමින් ඔවුන්ගේ හඬට සවන් යොමුවූයේද අවශ්‍යතා සපුරනු ලැබූවේද යන්න සහතික කළ යුතුයි.

- රජයයන් සහ මානුෂීය සේවා සංවිධාන ක්‍රියාකාරීන් නව සහ වඩාත්ම සැලකිල්ලට ලක්විය යුතු ප්‍රමුඛතා සඳහා ඔවුන්ගේ අවධානය යොමුකර සිටින විට සිවිල් සමාජයේ අපි මානව අයිතිවාසිකම් ප්‍රමිතීන් පිළිබඳ තැකීමකින් තොරව ඉඩම් වන සම්පත සහ ස්වභාවික සම්පත් අත්පත් කරගැනීමට වසංගත තත්වයන් උපයෝගී කරගන්න රජයේ සහ ව්‍යාපාරික අභිමතාර්ථයන්ගෙන් කටයුතු කරන අය පිළිබඳව විමසිලිමත්ව සිටිය යුතුය. මෙහිදී අපි විශේෂයෙන්ම ඉඩම් සම්බන්ධ ගැටුම් අධීක්ෂණය කිරීමටත් ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගැනීමට කටයුතු කරන අවස්ථාවන් පිළිබඳ සැලකිලිමත් විය යුතුයි.

- දැනට පවත්නා වසංගත තත්වය හේතු කොටගෙන වැඩිවී තිබෙන අපගේ සමාජයේ සහ සමාජ මාධ්‍යයන්හි පුද්ගලයින්ගේ වාර්ගිකත්වය, ජාතිකත්වය, ස්ත්‍රීපුරුෂභාවය සහ ලිංගිකත්වය, ආගම, කුලය සහ සමාජ පන්තිය පදනම් කරගෙන දිනෙන් දින වර්ධනය වන්නාවූ සාවද්‍ය තොරතුරු, පූර්ව විනිශ්චයන් වෙනස්කොට සැලකීම් වලට එරෙහිව කටයුතු- කිරීමට සිවිල් සමාජ සංවිධාන දිරිගන්වන්නෙමු.

- වෛරස් ආසාදනය හෝ රෝගය ව්‍යාප්තවීමේදී එහි දෝෂාරෝපණය සාමාන්‍යයෙන් එල්ලවන්නේ ජනවාර්ගික සුලුතරයන් සහ ස්වදේශිය කණ්ඩායම්, අනාථයින්, ආපසු සියරට පැමිණෙන්නන්, සංක්‍රමණිකයින්, දරිද්‍රතාවයෙන් පෙළෙන වැසියන් සහ සෞඛ්‍ය සේවකයින්ටය. අපි සියලු දෙනාම එකාවන්ව නැගී සිටිමින් වාර්ගිතක්වයට, පූර්ව විනිශ්චයට සහ වෙනස් කොට සැලකීමට එරෙහි විය යුතුවේ. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මේ සඳහා අප උපයෝගී කරගන්නා මෙවළම විය යුතුයි.

- සිවිල් සමාජ සංවිධාන සාමුහිකව සාකච්ඡා කරමින් සහ ප්‍රජාව සමගින් එක්ව නැවත යථාතත්වයට පත්කිරීමට, පෙර සූදානම්වීම ශක්තිමත් කිරීමට, ආහාර සුරක්ෂිතතාවය සහ ස්වයං සහාය ඇතිකිරීමට, දේශිය වශයෙන් ඔරොත්තුදීමේ ශක්තිය වැඩි කිරීමට සහ සියලුදෙනාටම සමාජ ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. සිවිල් සමාජ සංවිධාන දේශීය ජීවනෝපාය මාර්යන්ට සහාය දීමේ සහ ස්වීය ආහාරසැපයුමක් සඳහා සහාය වීමේ දක්මකින් යුතුව දේශපාලන සහ ව්‍යාපාරික කණ්ඩායම් සමග එක් වෙමින් සාර්ව, විමධ්‍යගතවූ, සහභාගිත්වයෙන් යුත් සහ කාලගුණයට ඔරොත්තුදෙන ඉඩම් භාවිතාවක් සහ සංවර්ධන සැලසුම් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුයි.

## අනාගත දැක්ම

වර්තමානයේ පවත්නා අභියෝගයන් හමුවේ වුවද සිවිල් සමාජ ක්‍රියාකාරකම් අඩුවී නොමැත. කාර්යය සම්පාදන දුෂ්කරතා නිසා අධෛර්යමත් නොවී ඇත්ත වශයෙන්ම මෙම වසංගත තත්වය මගින් ස්වේච්ඡා සේවය, මානුෂිය සේවාවන්හි, සාරය ප්‍රබෝධමත් කර ඇති අතර කණ්ඩායම් අකර සිවිල් ක්‍රියාකාරීන් අතර පවුල් සහ පුද්ගලයින් අතර විශේෂයෙන්ම තරුණයින් අතර සිවිල් ක්‍රියාකාරකම් වර්ධනය වී ඇත. මෙම පුරවැසියන්ගේ ක්‍රියාකාරකම් වලට සහාය ලබාදිම, මාර්ගෝපදේශ සැපයීම සහ පවත්වාගෙන යාම සිදුකළ යුතු අතර එමගින් ඔවුන් සමාජ පරිනාමන බලවේගය බවට පත්වනු ඇත.
කෘෂිකර්ම ප්‍රතිසංශෝධන සහ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ රාජ්‍ය නොවන සංවිධාන සංසදය වන අපි පසුකරමින් සිටින මෙම අස්ථාවර දුෂ්කර කාලසීමාවෙහි අපගේ ජාලයේ සහ ඉන් පරිබාහිරව අත්දැකීම්, උගත්පාඩම්, නවසොයාගැනීම් සහ සාක්ෂි පදනම් කරගත් නිර්දේශයන් පාර්ශවකරුවන් බෙදාහදා ගැනීමට අඛණ්ඩව කටයුතු කරන්නෙමු. එසේම අපි ආහාර සහ නිදහස, රැකියාවන් සහ යුක්තිය, ඉඩම් සහ ශ්‍රමය, සාමය හා සෞභාග්‍ය වර්තමාන සහ අනාගත පරම්පරාවන් වෙනුවෙන් සුරැකීමට අඛණ්ඩවම ප්‍රයත්න දරන්නෙමු.

ආහාර ස්වීයත්වය (ස්වයං ආහාරනිෂ්පාදනය ) කෘෂිකර්මය සඳහාවූ වැඩසැලැස්ම වශයෙන් සලකමින් ANGOC ජාලය සහ එහි පාර්ශවකරුවන් දීර්ඝකාලයක් පුරා ආහාර ස්වීයත්වය සඳහා උද්දේශනයේ නිරතවී සිටින අතර මෙයට ආහාර නිෂ්පාදනයේ කෘෂි ජෛවීය පද්ධති agro-ecological systems of food production මගින් සහාය ලබාදේ. ආහාර පද්ධති ප්‍රජාත්‍රාන්තික ආකාරයෙන් පාලනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදය පවතිනවාද යන්න සඳහා හොඳම පරීක්ෂණයයි කෘෂිකර්මය මත විශ්වාසය තැබීමෙන්, ආහාර නිෂ්පාදනයෙන් සහ ලෝක වෙළඳපළට විකිණීම මගින් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කළ නොහැක.

ප්‍රජාමට්ටමේ සැලසම් සහ ක්‍රියාකාරකම් සඳහා පදනමක් සැපයීම සඳහා ඉදිරිපියවරක් ලෙස දී ANGOC ජාලය නිවැරදි සහ ප්‍රජාමට්ටමේ තොරතුරු ජනනය කරවමින් කුටුම්භ සහ ප්‍රජාමට්ටමේ ආහාර සුරක්ෂිතතාවය තක්සේරු කිරීමට කටයුතු කරනු ඇති අතර මෙම ගම්මට්ටමේ මූලාරම්භයන් ජනතාව කේන්ද්‍රකරගත් ප්‍රතිපත්ති අභිදේශන සමග සහ ජාතික හා කළාප මට්ටමේ සජීවීකරණයනට සම්බන්ධ කරනු ඇත.

කුඩා පරිමානයේ ආහාර නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයන් අතර දුරප්‍රමාණය අඩු කිරීම සඳහා අපි ප්‍රාදේශිය ආහාර කේන්ද්‍රයන් පිහිටුවීමට කටයුතු කරනු ඇත.

අවසාන වශයෙන් අප මෙම ප්‍රකාශය වැඩිදියුණු කිරීමේ සහ බෙදාහැරීම සඳහාත් එකිනෙකාගෙන් ඉගෙන ගැනීමට සහ සාකච්ඡාවන් සංවර්ධනය කරගැනීමට අනෙකුත් සිවිල්සමාජ සංවිධාන සහ ජාලයන් සම්බන්ධකරගැනීමට අපේක්ෂා කරන්නෙමු. අපි එක්ව ක්‍රියාකිරීම මගින් අභියෝගයන්ට ඔරොත්තුදිය හැකි හා සහනුකම්පාවෙන් යුත් හෙට දිනයක් නිර්මාණයකළ හැකිය.

**මහජනතාව කේන්ද්‍රකරගත් තිරසර සංවර්ධනයක් සඳහා ANGOC අඛණ්ඩව ක්‍රියාත්මක වේ**

*ආහාර සහ නිදහස*
*රැකියා සහ යුක්තිය*
*ඉඩම් සහ ශ්‍රමය*
*සාමය සහ සෞභාග්‍යය*

ආහාර මූලික මානව අයිතිවාසිකමක් වේ. එනමුත් නිදහස නොමැතිව එහි අර්ථයක් නොමැතිවේ. නිදහස යන තේමාව මගින් අපගේ උත්සාහයන් කේන්ද්‍රගත විය යුත්තේ දේශපාලන නිදහස සම්බන්ධයෙන් පමණක් නොව මේ හා සමානව වැදගත්කමකින් යුක්තව ආර්ථික නිදහස සහ අවස්ථාවන් පිළිබඳව ද මතකයට නංවයි . ආහාර සහ නිදහස ආසියානු වැසියන්ගේ -ඇත්ත වශයෙන්ම ඕනෑම ප්‍රජාවක වඩාත්ම මූලික අයිතිවාසිකම් වේ.

නිදහස පිළිබඳව ආසියානු සමාජයේ කැපීපෙනෙන වටිනාකමක් තිබේ. එනම් සියලුදෙනාම සඳහා වූ දිගුකල් පවත්නා ආචාරධර්මයක් - අතීතයේ පොදු දරිද්‍රතාවයේ සිට අනාගතයේ පොදු සෞභාග්‍ය කරා ගමන් කිරීමයි . ලෝකවෙළඳාම නිදහස්වීම සහ ගෝලීයකරණය පිළිබඳව සැලකිලිමත්වන එය ප්‍රජාව මූලික කරගත් යුක්තිධර්මයකි .

ආසියාවේ විශාල සහ විවිධත්වයක් ගන්නා වූ ඉඩම් සහ ජල සම්පත් ඉක්මනින් විනාශයට පත්වීමට ගෝලීයකරණයද හේතුවක් වී ඇත. එමනිසා ආසියානු රාජ්‍ය නොවන සංවිධාන වැඩි වැඩියෙන් සක්‍රීයව පරිසරය සුරැකීමේ ව්‍යාපාරවලට සම්බන්ධවී අඛන්ඩව කටයුතු කළ යුතු අතර මෙමගින් ජෛගෝලීයසහජීවනය පිළිබඳව විශ්වීය වශයෙන් දක්වන සැලකිල්ල පැහැදිලිව ප්‍රකාශයට පත් කළ හැකිය.

බොහොමයන් ආසියානු ගැමියන් ඔවුන්ට හිමිකමක් නොමැති ඉඩම් වල වගාකරන අතර දැනට පවත්නා කෘෂිකාර්මික ආකෘතිය මගින් ඔවුන්ගේ ශ්‍රමය ඉඩම හා බැඳදමා සිරකර තිබේ. එමනිසා සියලු දෙනාගේ යහපත තකා ඉඩම් සහ ශ්‍රමය ශක්තිමත් කිරීම සඳහා පුලුල් කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ සිදුකිරීමේ අවශ්‍යතාවක් තිබේ.

අවසාන වශයෙන් නිදහසපතා සිදුකරනු ලබන යුද්ධ සහ ජනවාර්ගික ගැටුම්වලින් සමන්විත මෙම යුගයේදී ගෞරවාන්විතව පොදු සමාවක් ලබාදීම සහ අභිමානයෙන් යුත් සාමයක අවශ්‍යතාවය අපට සිහිපත් කරනු ලබයි. සංවර්ධනයෙන් තොර සාමයක් පැවැතිය නොහැකිවා සේම සාමයෙන් තොරව සෞභාග්‍යයක්ද නොමැතිවනු ඇත.

## Signed:

Asian NGO Coalition for Agrarian Reform and Rural Development (ANGOC)
Association for Land Reform and Development (ALRD)
Association of Voluntary Agencies in Rural Development (AVARD)
Community Development Assistance (CDA)
Community Self-Reliance Centre (CSRC)
Ekta Parishad (EP)
Konsorsium Pembaruan Agraria (KPA)
NGO Federation of Nepal (NFN)
Philippine Partnership for the Development of Human Resources in Rural Areas (PhilDHRRA)
Sarvodaya Shramadana Movement (SARVODAYA)
South Asia Rural Reconstruction Association (SARRA)
STAR Kampuchea (SK)

*8 September 2020*

*For those interested in signing on to this Statement in the spirit of solidarity, kindly inform the ANGOC Regional Secretariat at angoc@angoc.org.*

*Asian NGO Coalition for Agrarian Reform and Rural Development (ANGOC)*
*33 Mapagsangguni Street, Sikatuna Village, Diliman 1101 Quezon City, Philippines*
*angoc@angoc.org*
*+63 2 83510581 +63 2 83510011*

*This statement was translated by Sarvodaya Shramadana Movement.*